**CENTRE FOR MONITORING ELECTION VIOLENCE**
**මැතිවරණ ප්‍රචණ්ඩත්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය**
**தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்**

105/1, Fifth Lane, Colombo 3, Sri Lanka
**Tel:** 011 5621886, 011 5621904,011 2564404 **Fax:** 011 4722632
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org

## යාපනය මහ නගරසභාව, වව්නියා නගරසභාව සහ ඌව පළාත් සභා ඡන්ද විමසීම - 2009

### මැතිවරණ දින නිවේදනය

***අගෝස්තු මස 8 වන දින ප.ව. 7.00 ට*** යාපනය මහ නගර සභාව වව්නියා නගර සභාව සහ ඌව පළාත් සභා ඡන්ද විමසීම් වලදී ඡන්දය ප්‍රකාශ කිරීම සාපේක්ෂව ගත්කල සිදුවීම්වලින් තොරව සිදු වූ අතර ප්‍රදේශ තුනේ ඡන්දය පාවිච්චි කිරීමේ ප්‍රතිශතයන් පිළිවෙලින් 20% 49% සහ 62% ක් වශයෙන් විය. ඡන්දය පැවති ප්‍රදේශයන් අතුරින් යාපනය මහනගර සභාව කෙරෙහි වඩාත් අවධානය යොමු වූයේ එය යුද්ධයෙන් පසු ප්‍රධාන වශයෙන්ම දෙමළ ප්‍රදේශයක් වූ ඡන්ද බල ප්‍රදේශයක පැවති පළමු මැතිවරණය වූ නිසාය. මේ අනුව බලන කල 20%ක් වූ ඡන්දය පාවිච්චි කල සංඛ්‍යාව සඵලදායක අනුපාතයක් ලෙස ගත්කල 40%ක් ලෙස සැලකිය යුතු වන්නේ මහ නගරසභා බලප්‍රදේශය තුළ පදිංචිව සිටින සහ ඡන්දය පාවිච්චි කිරීමට හැකි ව සිටින ඡන්දදායකයන් සංඛ්‍යාව ඡන්ද හිමි නාමලේඛණයේ සඳහන් සංඛ්‍යාව නොව දළ වශයෙන් ඉන් අඩක් වන බැවිනි. ඡන්ද කාඩ්පත් 41000 ක් පමණ තැපැල් කාර්යාලවල ඉතිරිව ඇත. අපේක්ෂිත ඡන්දදායකයන් හට මේවා බෙදාහැරීම කළ නොහැකි වූයේ ඔවුන් ඒවා භාර ගැනීම සඳහා ඡන්ද කාඩ්පත්වල සඳහන් ලිපිනයන් හී පදිංචි ව නොසිටි නිසාය. ඡන්ද දිනය වන අද දින පස්වරු 3.00 වන තෙක් තැපැල් කාර්යාලවලදී ඡන්දදායකයන් හට එම ඡන්ද කාඩ්පත් ලබා ගැනීමට ඉඩකඩ සලසා තිබිණි.

යාපනයේ අඩු සංඛ්‍යාවක් වූ ඡන්ද ප්‍රකාශ කිරීම සාධක ගණනාවක් නිසා සිදුවිය. මූලික වශයෙන් ඡන්දදායකයන් විදේශ ගතවීම, ඔවුන් තම ජීවන වෘත්තීන්හී නියැළෙමින් සිටීම, ජන ජීවිතයේ ගුණාත්මකභාවය, රට තුළ අවතැන්වූවන් ගේ තත්ත්වයේ බලපෑම සහ මෙම කාලවකවානුව තුළ මැතිවරණයන් පැවැත්වීම අනවශ්‍ය වූවක් බව සිතීම නිසා හෝ ඡන්ද ප්‍රතිඵලය දැනටමත් තින්දු වී අවසන් ය යන නිගමනය නිසා හෝ එසේත් නැතිනම් මැතිවරණය තමන් ගේ ප්‍රමුඛතාවයන්ට වෙනස් වූ වෙනත් දේශපාලන ප්‍රමුඛතාවයන් අනුව පැවැත්වෙන්නක් ලෙස සිතීම නිසා හෝ ඇති වූ ඡන්දදායක උණුසුම හීන වීම මීට දායක වන බව පෙනේ.

ඡන්දය ප්‍රකාශ කිරීම අඩුවීම කෙරෙහි බලපෑ මෙම අවසන් කරුණ අවධාරණය කිරීමට මැ.ප්‍ර.නි.ම. කැමතිය. විශේෂයෙන් ම ඡන්දදායකයන් ලියාපදිංචි කිරීම පිළිබඳව රට තුළ අවතැන්වූවන් හට ලබාදෙනු ලැබූ තොරතුරුවල ප්‍රමාණවත්භාවය මෙන්ම මෙම කඳවුරුවල සිටින ඡන්දදායකයන් වෙත වූ දේශපාලන පක්ෂවල ප්‍රවේශය වැනි කැපීපෙනෙන ගැටලු පවති. මෙම කඳවුරුවල දේශපාලන කටයුතු සිදු කිරීමට එරෙහිව පවත්නා බොහෝමයක් වූ සාධක පිළිබඳව මැ.ප්‍ර.නි.ම.ය ට සම්පූර්ණ අවබෝධයක් ඇත. එමෙන්ම ඒවා මගින් මෙම කාලයේදී මැතිවරණ පැවැත්වීමෙහි ඇති නුසුදුසුභාවය පිළිබඳ වූ තර්කය ශක්තිමත් කරන බව මැ.ප්‍ර.නි.ම.ය පිළිගනී.

ඌව පළාත්සභා මැතිවරණයේ දී පාලක සන්ධානය හා විශේෂයෙන්ම ප්‍රධාන ඇමති අපේක්ෂක ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් රාජ්‍ය සම්පත් අයුතු ලෙස උපයෝජනය පිළිබඳ චෝදනා රාශියක් මැ.ප්‍ර.නි.ම.ය වෙත ලැබී ඇත. මෙසේ රාජ්‍ය සම්පත් අයුතු ලෙස උපයෝජනය සියලු මැතිවරණයන්හි දී නැවත නැවතත් සිදුවූ නරක භාවිතයක් වේ. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනය ක්‍රියාත්මක කිරීම සහ මැතිවරණ ක්‍රියාවලියේ සුපිළිපන් බව ආරක්ෂා කිරීමේ සහ ශක්තිමත් කිරීමේ වගකීම දරණ රාජ්‍ය ආයතනික හස්තයන් සඳහා වූ ස්වාධීන කොමිසන් සභා ස්ථාපිත කිරීම කේන්ද්‍රීය වැදගත්කමකින් යුතුය යන මැ.ප්‍ර.නි.ම.ය, එහි සංයුක්ත සංවිධාන, සහ අනෙකුත් සිවිල් සමාජ සංවිධානවල තර්කය වඩ වඩාත් ශක්තිමත් කරවයි.

මැ.ප්‍ර.නි.ම. යාපනය මහ නගර සභාවට අදාලව බරපතල සිදුවීම් **2** ක් සහ බරපතල නොවන සිදුවීම් 2 ක් වාර්තා වී ඇති අතර වවුනියා නගර සභාවට අදාළව බරපතල සිදුවීම් 3ක් හා බරපතල නොවන සිද්ධීන් 2 ක් වාර්තා වී ඇත. තවද ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රස් අපේක්ෂකයන් දෙදෙනෙකුට එරෙහිව පහරදීමේ සිදුවීම් දෙකක් සහ ඉලංකෙයි තමිල් අරසු කච්චි ආධාරකරුවෙකුට එරෙහිව සිදුකල පහරදීමේ සිද්ධියක් පුත්තලම් ප්‍රදේශයේ දී (යාපන මහ නගරසභාවට අදාළව) වාර්තා වූ අතර ඊරෝස් සංවිධානයේ ආධාරකරුවෙකුට එරෙහිව සිදුකල පහරදීමේ සිද්ධියක් ද වව්නියාවෙන් වාර්තා වී ඇත. ඡන්ද විමසීම පැවැත්වෙන අතරතුර ඡන්ද ව්‍යපාරයේ යෙදුණු සිද්ධීන් 2 ක් සම්බන්ධයෙන් වන වාර්තා ද මැ.ප්‍ර.නි.ම. වෙත වව්නියාවෙන් ලැබී ඇත.

ඌව පළාත් සහා ජන්ද විමසීමට අදාලව ජන්ද විමසීම පැවති දිනයේ බදුල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ මුළු සිද්ධීන් ගණන 14 ක් වන අතර මොණරාගල දිස්ත්‍රික්කයේ එම ගණන 20 කි. එ අතුරින් බදුල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ බරපතල සිද්ධීන් ගණන 7 ක් වන අතර මොණරාගල දිස්ත්‍රික්කයේ එම ගණන 4 කි.

මෙසේ වාර්තාවන සිදුවීම් අතරින් සිද්ධීන් දෙකක් බදුල්ල දිස්ත්‍රික්කයට අදාල පහරදීමේ සිද්ධීන්ය. මොණරාගල දිස්ත්‍රික්කයෙන් ද එක් පහරදීමේ සිද්ධියක් වාර්තාවේ.

මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂකයින් හට නිරීක්ෂණය සඳහා ජන්ද මධ්‍යස්ථාන තුළට යාමට අවසර නොදීමේ අවස්ථා තුනක් බදුල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර ඒ හා සමාන සිද්ධීන් දෙකක් මොණරාගල දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වී ඇත.

බදුල්ල දිස්ත්‍රිකකයේ ජන්ද පොල නියෝජිතයෙක් එ.ජ.නි.ස යේ අපේක්ෂකයන් වෙනුවෙන් ජන්ද ප්‍රචාරක පත්‍රිකා බෙදාහැරීමේ සිද්ධියක් වාර්තා වී ඇත. එමෙන්ම ජන්දය භාවිතා කිරීම හා සබැඳි සිදුවීමක් මොණරාගල දිස්ත්‍රීක්කයෙන් වාර්තා වන අතර මෙම සිදුවීම් අතරින් කිහිපයක් පිළිබඳව විස්තර පහත දැක්වේ.

**ජන්ද අපේක්ෂකයන්ට පහරදීම**

පස්වරු 12.00ට පමණ ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රස් අපේක්ෂකයන් වන මක්කන්කොලු රවිචන්ද්‍රන් (මනාප අංක 09) සහ අබ්දුල් ලතීෆ් මොහොමඩ් මුනාෆර් (මනාප අංක 2) යන අය යතුරු පැදියකින් තම ජන්ද මධ්‍යස්ථානය වෙත ගමන් කරමින් සිටිය දි නැවත පදිංචි කිරීමේ කටයුතු පිළිබඳ අමාත්‍ය රිෂාඩ් බදියුදීන්ගේ එ.ජ.නි.ස ආධාරකරුවන් වව්නියාව පට්ටනිච්චිපුල්ලයන්කුලම් මුස්ලිම් මහා විද්‍යාල ජන්ද මධ්‍යස්ථානයේදී (ජන්ද මධ්‍යස්ථාන අංක 01) පහර දි ඇත. අබ්දුල් ලතීෆ් මොහොමඩ් ට අනුව පහරදීම සඳහා පුද්ගලයන් පැමිණ ඇත්තේ ලියාපදිංචි අංක 251-5092 දරණ ටොයෝටා හයිඑස් වෑන් රථයෙනි. මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ නිරීක්ෂකයන් වෙත වැඩිදුරටත් කරුණු දක්වමින් පවසා සිටියේ අදාළ වාහනය තමා යටකරමින් ධාවනය කිරීමට උත්සාහ කල බවත් මෙම පහරදීමට සම්බන්ධ වූ රිස්නි, රෆීස්, රිෆ්නියාන්, මජිඩ් සහ නසීල් ආදීන් අමාත්‍ය රිෂාද් බදියුදීන්ගේ (සමස්ත ලංකා මුස්ලිම් කොන්ග්‍රසය) ආධාරකරුවන් ලෙස හඳුනාගත් බවයි.

වව්නියාව මූලික රෝහල් පොලිස් මුරපොලෙහි පොලිස් කොස්තාපල් ටී විමලජිත් මැ.ප්‍ර.නි.ම.ට අදාල සිදුවීම සනාථ කරමින් පැවසුවේ මුක්කන්කොලු රවිචන්ද්‍රන් සුළු තුවාල සහිතව රෝහලට ඇතුලත් කල බවයි. මැ.ප්‍ර.නි.ම අදාල සිදුවීම සම්බන්ධයෙන් අමාත්‍ය රිෂාඩ් බදුයුදින් ගෙන් කරුණු විමසු අවස්ථාවේ දි එවැනි සිදුවීමක් පිළිබඳ තමන්ට ද දැන ගැනීමට ලැබුණු බවත් අදාල සිදුවීමට තමාගේ කිසිදු සම්බන්ධයක් නොමැති බවත් පැවසුවේය. ඔහු තවදුරටත් අදහස් දක්වමින් කියා සිටියේ එය අදාල පුද්ගලයන් දෙදෙනා අතර ඇතිවූ පෞද්ගලික ආරවුලක් බවයි.

**ජන්දදායකයන්ට හා ආධාරකරුවන්ට පහරදීම**

පෙරවරු 8.00 ට ඉලංකෙයි තමිල් අරසු කච්චි අපේක්ෂක මොහොමඩ් අලිම් ජමාල්දීන් ගේ (මනාප අංක 12) රියදුරු එච්.එස්.එම් නසීර් හට අමාත්‍ය රිෂාද් බදියුදීන්ගේ ආධාරකරුවන් වූ එම්.මුජාහිර් ඇතුලු තවත් පිරිසක් විසින් පහර දි ඇත.

මැ.ප්‍ර.නි.ම ය ට වාර්තා වූ පරිදි අදාල රියදුරා පහර කෑමට ලක් වී ඇති අතර වාහනයට ද හානි සිදුව ඇත. එච්.එස්.එම් නසීර් මහතා මෙම සිදුවීම සම්බන්ධ පැමිණිල්ලක් පුත්තලම පොලිසිය වෙත ද පසුව ඉදිරිපත් කර ඇත. (පැමිණිලි අංක සි.අයි.බී 0290-57) පෙරවරු 11.30ට පමණ මැ.ප්‍ර.නි.ම. ජංගම නිරීක්ෂණ කණ්ඩායම වාර්තා කළ පරිදි ඊරෝස් පක්ෂයේ ආධාරකරුවෙකු වූ සිවකුමාරන් හට ප්‍රජාතන්ත්‍රවාදි මහජන විමුක්ති පෙරමුණේ (ප්ලොට්) ආධාරකරුවන් පිරිසක් වෑන් රථයකින් පැමිණ කුරුමන්කඩු ග්‍රාමීය සංවර්ධන සමිති ජන්ද මධ්‍යස්ථානයේදී (ජන්ද මධ්‍යස්ථාන අංක 03) පහරදී ඇත. පහර කෑමට ලක් වූ සිවකුමාරන් සුළු තුවාල ලබා ඇත.

සිද්ධියට අදාල පොලිස් පරීක්ෂණ පැවැත්වෙන අතර ප්ලොට් සංවිධානයේ කණ්ඩායම් නායක තමෝදරන් පිල්ලෙයි ලිංගනාදන් (මනාප අංක 02) එම සිදුවීම හා සම්බන්ධයෙන් තම පක්ෂයට එරෙහිව නැගෙන සියලු චෝදනා ප්‍රතික්ෂේප කළේය. පොලිසිය විසින් ද මෙම සිදුවීම තහවුරු කරන ලදි.

මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල ජන්ද කොට්ඨාශයේ කරමැටිය කනිෂ්ඨ විද්‍යාලයේ ජන්ද මධ්‍යස්ථානයේ දි (ජන්ද මධ්‍යස්ථාන අංක 50) පස්වරු 3.15ට පමණ ජන්දදායකයෙක් පහරකෑමට ලක්ව ඇත. අදාළ පහරදීම සිදුකර ඇත්තේ එම ජන්ද මධ්‍යස්ථානයේ රාජකාරියේ නියුක්තව සිටි පොලිස් නිලධාරියෙක් විසිනි.

මැ.ප්‍ර.නි.ම යේ ක්ෂේත්‍ර නිරීක්ෂකයෙක් දැක්වූ පරිදි අදාළ පහරදීම සිදුව ඇත්තේ ඡන්දදායකයන්ගේ හඳුනා ගැනීමේ ලේඛණ සම්බන්ධයෙන් පොලිස් නිලධාරියා හා ඡන්දදායකයා අතර ඇතිවූ බහින්බස් වීමක් අතරතුරදීය.

බදුල්ල දිස්ත්‍රික්කයේ  මහියංගනය මැතිවරණ කොට්ඨාශයේ ඔරුබැඳිවැව මධ්‍ය මහා විද්‍යාල ඡන්ද මධ්‍යස්ථානයෙන්  (ඡන්ද මධ්‍යස්ථාන අංක 48) පහරදීමකට අදාල බරපතල සිදුවීමක් වාර්තා වි ඇත. එ.ජ.නි.ස අපේක්ෂක අනුර රවීන්ද්‍ර විදානගමගේ ගේ (මනාප අංක 06) ආධාරකරුවන් 20 කට ආසන්න පිරිසක් පෙරවරු 11.00ට පමණ රිය පෙළකින් එක්සත් ජාතික පක්‍ෂ රිදීමාලියැද්ද ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එම්.මුතුබංඩාගේ නිවසට ගොස් ඔහුට හා ඔහුගේ බිරිඳට පහරදී ඇත. මුතුබංඩා මහතා වහා මහියංගනය රෝහල වෙත ඇතුලත්කර ඇති අතර වාට්ටු අංක 08 හි තම තුවාල සඳහා  ප්‍රතිකාර ලබමින් සිටී.

ඔහු පොලිස් ආරක්ෂාව යටතේ රෝහලෙහි ප්‍රතිකාර ලබන අතර මහියංගන පොලීසියට ද පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. එම සිදුවීම පොලිස් ස්ථානාධිපති ඉලංගකෝන් විසින් ද තහවුරු කරන ලදි. මෙම සිදුවීම මැ.ප්‍ර.නි.ම ය ට වාර්තා කරන ලද්දේ බදුල්ල දිස්ත්‍රික් එජාප පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතාගේ ලේකම්වරයායි. මෙම සිදුවීම සම්බන්ධයෙන්  මැ.ප්‍ර.නි.ම.ය අනුර විදානගමගේ ගෙන්  විමසු අවස්ථාවේ දි ඔහු පැවසුයේ මෙම සිද්ධියට තමාගේ කිසිදු සම්බන්ධයක් නොමැති බවයි.

**ඡන්ද විමසීම අතරතුර ඡන්ද ව්‍යපාරයේ යෙදීම**

පෙ.ව 11.20 ට පමණ බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල මැතිවරණ කොට්ඨාශයේ යෙල්වර්ටන් වත්ත දෙමළ විද්‍යාලයේ ඡන්ද මධ්‍යස්ථානය (ඡන්ද මධ්‍යස්ථාන අංක 28) ඉදිරිපිට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්‍ෂකයන් වන එස් එච් සෝමපාල (මනාප අංක 11) සහ නීතිඥ සුජිව ජයසිංහ (මනාප අංක 21) යන අයගේ ප්‍රචාරක පත්‍රිකා බෙදාහැර ඇත. මැ.ප්‍ර.නි.ම යේ ක්ෂේත්‍ර සම්බන්ධීකාරකවරයාට අනුව ඊ.ජේ.පී. චන්ද්‍රකුමාරි ඇතුලු තවත් හයදෙනෙක් ප්‍රචාරක පත්‍රිකා බෙදාහැරීමේ ක්‍රියාවට වගකිවයුතු යැයි චෝදනා ලබා ඇත. පොලිසිය දෙවරක් මෙම  කණ්ඩායමට  ඉවත්ව යන ලෙස ද අවවාද කර ඇත. ඉහත චන්ද්‍රකුමාරි නැමැත්තිය එම ඡන්ද මධ්‍යස්ථානයේ දි ම එ.ජ.නි.ස ඡන්ද පොළ නියෝජිතයෙක් ලෙස උදේ කාලයේ කටයුතු කර ඇති අතර සහකාර තේරීම් භාර නිලධාරියාට ද තර්ජනයකර ඇත.

ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ ඡන්ද අපේක්ෂක ඒ. එස් මොහොමඩ් සවාහිර් (මනාප අංක 02) බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ඡන්ද කොට්ඨාශයේ  ගුරුතලාව ශාන්ත තෝමස් විද්‍යාල ඡන්ද මධ්‍යස්ථානයට (ඡන්ද මධ්‍යස්ථාන අංක 48) පෙරවරු 10.30ට පමණ පැමිණ ඇත. ලියාපදිංචි අංක 51-9305 දරණ අංක සහිත රථයෙන් පැමිණ ඇති ඔහුගේ රථය පෝස්ටර් වලින් සරසා තිබූ අතර ඡන්ද මධ්‍යස්ථානය ඉදිරිපිට ඔහුගේ ආධාරකරුවන්ද සමග කතා කරමින් සිට ඇත. මැ.ප්‍ර.නි.ම. ක්ෂේත්‍ර නිරීක්ෂකයන් වාර්තා කරන පරිදි මෙම කතාබහ අඩහෝරාවකට ආසන්න කාලයක් පැවතී ඇත.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර නිරීක්ෂකයන්ට අනුව පෙරවරු 10.20ට පමණ එ.ජ.නි.ස අපේක්ෂිකා හේමා රත්නායකට (මනාප අංක 24) වාසිසහගත වන්නාවූ ප්‍රචාරාත්මක කරුණු සඳහන් ආදර්ශ ඡන්ද පත්‍රිකා, බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ ඡන්ද කොට්ඨාශයේ සොරගුනේ මහා විද්‍යාල ඡන්ද මධ්‍යස්ථානය (ඡන්ද ම. අ. 35) ඉදිරිපිට විසුරුවා හැර තිබී ඇත.

එක්සත් ජාතික පක්ෂ ඡන්ද අපේක්ෂක හරින් ප්‍රනාන්දුට (මනාප අංක 23) අයත් ප්‍රචාරක පත්‍රිකා පෙරවරු 11.40 ට පමණ  බදුල්ල දස්ත්‍රික්කයේ හාලිඇල ඡන්ද කොට්ඨාශයේ යෙල්වර්ටන්වත්ත දෙමළ විද්‍යාලයේ ඡන්ද මධ්‍යස්ථානය (ඡන්ද මධ්‍යස්ථාන අංක 28) ඉදිරි පිට විසුරුවා හැර තිබී ඇත.

එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂක ශෂීන්ද්‍ර රාජපක්ෂගේ (මනාප අංක 13) ආධාරකරුවන් පිරිසක් විසින් මොණරාගල දිස්ත්‍රික්කයට අයත් මොණරාගල ඡන්ද කොට්ඨාශයේ මඩුගල්ල මහා විද්‍යාලය ඡන්ද මධ්‍යස්ථානයේ (ඡන්ද මධ්‍යස්ථාන අංක 60) ඉදිරිපිට ඡන්ද ව්‍යාපාරයේ යෙදුනු සිදුවීමක් මැ.ප්‍ර.නි.ම ක්ෂේත්‍ර නිරීක්ෂකයන් විසින් වාර්තා කර ඇත.

ඡන්ද මධ්‍යස්ථානයේ ප්‍රධාන පිවිසුම් දොරටුව ආසන්න පිවිසුම් මාර්ගය මත ජවිපෙ සංකේතය (සීනුව) සහ එ.ජ.නි.ස අපේක්ෂක ආරච්චිගේ විජත බේරුගොඩ (මනාප අංක 04) මනාප අංකය සලකුණු කොට ඇත.

**ඡන්දදායකයන් ප්‍රවාහනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ ඡන්ද කොට්ඨාශයට අයත් කහගල්ල දෙමළ පාසල් ඡන්ද මධ්‍යස්ථානය (ඡන්ද මධ්‍යස්ථාන අංක 05) වෙත ඡන්දදායකයන් ප්‍රවාහනය කිරීමේ සිද්ධියක් පෙරවරු 10.30 ට පමණ වාර්තා විය. මෙසේ ඡන්දදායකයන් ප්‍රවාහනය කර ඇත්තේ  එ.ජ.නි.ස. අපේක්ෂක එම්. කේ. විශ්වනාදන් මහතාගේ (මනාප අංක 17) ආධාරකරුවන් විසින් වන අතර  ඒ සඳහා යොදා ගෙන ඇත්තේ ලියාපදිංචි අංක එල්සී-6220 සහ

කේ අයි 7867 අංක දරණ පිජ් රථයි. එම අවස්ථාවේ දී අදාල ජන්ද අපේක්ෂකයා ජන්ද මධ්‍යස්ථානය තුළ සිටි බවට මැ.ප්‍ර.නි.ම ජංගම නිරීක්ෂකයින් වාර්තා කර ඇත.

බදුල්ල දිස්ත්‍රික්කයට අයත් හපුතලේ ජන්ද කොට්ඨාශයේ අංක 01 දරණ හපුතලේ දෙමළ මහ විද්‍යාලයේ ජන්ද මධ්‍යස්ථානය වෙත (ශාලා අංක 01) පෙරවරු 11.00 ආසන්න කාලය තුළ ජන්දදායකයන් ප්‍රවාහනය කළ බවට මැ.ප්‍ර.නි.ම ජංගම නිරීක්ෂකයන් වාර්තා කර ඇත. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්ෂක එම්. කේ. විශ්වනාදන් (මනාප අංක 17) මහතාගේ ආධාරකරුවන් ලියාපදිංචි අංක 62-1936 දරණ වෑන් රථයෙන් මෙසේ ජන්දදායකයන් ප්‍රවාහනය කිරීම සිදුකර ඇත.

එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂක ශෂීන්ද්‍ර රජපක්ෂගේ ( මනාප අංක 13) පෝස්ටර් අලවන ලද එච් එෆ් 4952 දරණ ලියාපදිංචි අංක සහිත සුදු පැහැති වෑන් රථය මගින් මොණරාගල දිස්ත්‍රික්කයට අයත් මොණරාගල ජන්ද කොට්ඨාශයේ කන්දඋඩපංගුව මහා විද්‍යාල ජන්ද මධ්‍යස්ථානය (ජන්ද මධ්‍යස්ථාන අංක 7) ජන්දදායකයන් ප්‍රවාහනය කළ බවට වාර්තා වී ඇත. මැ.ප්‍ර.නි.ම ක්ෂේත්‍ර නිරීක්ෂකයාට අනුව මෙම සිදුවීම සිදුවී ඇත්තේ පස්වරු 12.25ටය.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ මැතිවරණ නිරීක්ෂකයන් වාර්තා කල පරිදි යාපනය මහනගර සභා බලප්‍රදේශයට අයත් ජන්ද මධ්‍යස්ථාන අංක 22, කොලොම්බුතුරෙයි හින්දු මහා විද්‍යාල ජන්ද මධ්‍යස්ථානය (ශාලා අංක 01) වෙත 'විශේෂ සේවා' යන නාමය සටහන් කළ බස්රථයක් මගින් ජන්දදායකයන් ප්‍රවාහනය සිදුකර ඇත. (කවර පක්ෂයකට අයත්දැයි හඳුනාගෙන නැත).

**මැ.ප්‍ර.නි.ම. යේ නිරීක්ෂකයන් හට ජන්ද මධ්‍යස්ථාන තුළට පිවිසීමට අවසර ලබාදීම ප්‍රතික්ෂේප කිරීම**

ප.ව. 2.40ට පමණ මැ.ප්‍ර.නි.ම. ජංගම නිරීක්ෂකයන් හට තම නිරීක්ෂණ කටයුතු සඳහා ජන්ද මධ්‍යස්ථානය තුළට පිවිසීමට ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයා ඉඩ ලබා නොදුනි. මැ.ප්‍ර.නි.ම. යේ ක්ෂේත්‍ර නිරීක්ෂකයා වාර්තා කළ පරිදි මෙම සිදුවීම බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය ජන්ද කොට්ඨාශයේ දික්කෙන්දයාය ප්‍රාථමික විදුහල් ජන්ද මධ්‍යස්තානයේදී (ජන්ද ම.අ. 58) සිදුව ඇත. මැතිවරණ නිරීක්ෂණය සඳහා මැ.ප්‍ර.නි.ම. වෙත මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත්කර තිබූ ලිපිය නිරීක්ෂකයන්, ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයා වෙත ඉදිරිපත් කල ද ඔහු ඒ පිලිබඳ කිසිදු සැලකිල්ලක් නොදැක්වූ බව වාර්තා වේ.

බදුල්ල දිස්ත්‍රික්කයට අයත් මහියංගනය ජන්ද මධ්‍යස්ථානයේ ජන්ද මධ්‍යස්ථාන අංක 43 දරණ අභයපුර කණිෂ්ඨ විද්‍යාලිය ජන්ද මධ්‍යස්ථානයේ ජන්ද නිරීක්ෂණය සඳහා ඇතුලුවීමට ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයා අවසර ලබානොදුන බව වාර්තා වේ. ජංගම නිරීක්ෂකයන් ඔහු විසින් එම ජන්ද මධ්‍යස්ථානයෙන් ඉවත් කිරීමට පියවර ගෙන තිබූ අතර හඳුනා ගැනිමේ ලේඛණ පිළිබඳවද අවධානයක් යොමු කොට නැත.

පස්වරු 2.30ට පමණ මැතිවරණ කෙමසාරිස්වරයා ජන්ද නිරීක්ෂණයට අදාලව ඉදිරිපත් කර තිබූ ලිපිය ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයා වෙත ඉදිරිපත් කළද ඒ පිළිබඳ අවධානයක යොමු නොකොට මැ.ප්‍ර.ම.නි.යේ ජංගම නිරීක්ෂකයන් හට ජන්ද මධ්‍යස්ථානයට ඇතුලුවීමට අවස්ථාව ලබා නොදීමේ සිද්ධියක් මොණරාගල දිස්ත්‍රිකකයේ වැල්ලවාය ජන්ද කොට්ටාශයේ හම්බේගමුව අංක 93 දරන රතඹල/අරඹලඅරගම කණිෂ්ඨ විද්‍යාලයෙන් වාර්තා වේ.

මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල ජන්ද කොට්ඨාශයට අයත් ජන්ද මධ්‍යස්ථාන අංක 81 දරණ බඩල්කුඹුර නිශ්ශංක මධ්‍ය මහ විද්‍යාලය, ජන්ද මධ්‍යස්ථානයේ (ශාලා අංක 01) ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිරයා ප.ව. 12.00 ට පමණ මැ.ප්‍ර.නි.ම. ජංගම නිරීක්ෂකයන් හට ජන්ද නිරීක්ෂණය සඳහා ජන්ද මධ්‍යස්ථානය තුළට ඇතුලු වීමට අවස්ථාව ලබා දී නොමැත. එහි දී ද මැතිවරණ කොමසාරිවරයා නිකුත් කර තිබූ අවසර පත්‍රය ඉදිරිපත් කළ ද එය පිළිගෙන නොමැත.

**ජන්දදායකයන් හඳුනාගැනීම**

බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල මැතිවරණ කොට්ඨාශයට අයත් ශ්‍රී රතනපාල කණිෂ්ඨ විද්‍යාල ජන්ද මධ්‍යස්ථානයේ (ජන්ද.ම. අ 21) නිරීක්ෂණයේ යෙදුනු මැ.ප්‍ර.නි.ම. ස්ථානගත නිරීක්ෂකයාට අනුව ජන්දදායකයන් හඳුනා ගැනිමට අදාල සිද්ධියක් පෙරවරු 10.30ට පමණ වාර්තා වී ඇත. ජන්දදායකයන් පහත් හයත් අතර ප්‍රමාණයක් වලංගු රියදුරු බලපත්‍රය හඳුනා ගැනිමේ ලේඛනය ලෙස ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ ද ඔවුන්ට ජන්දය දැමීමේ අවස්ථාව අහිමි වී ඇත. තවද වලංගු රියදුරු බලපත්‍රයක් හිමි මෙම පිරිස වෙත ග්‍රාමසේවා නිලධාරියා වෙනත් කිසිදු තාවකාලික හඳුනා ගැනිමේ පත්‍රයක් ද නිකුත් කර නොතිබුණි. රියදුරු බලපත්‍රය මැතිවරණ කොමසාරිස්වරයා වලංගු හඳුනා ගැනිමේ පත්‍රයක් ලෙස දක්වා තිබුනද මේ පිලිබඳව කරුණු දැක්වූ ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයා පවසා ඇත්තේ ඔහු සතුව ඇති වලංගු හඳුනා ගැනිමේ ලේඛන පිළිබඳ නාම ලේඛණයේ රියදුරු බලපත්‍රය ගැන සඳහන් නොවන බවයි.

ජන්දදායකයන් හඳුනා ගැනිමට අදාලව තවත් සිදුවීමක් මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ජන්ද කොට්ඨාශයට අයත් ජන්ද මධ්‍යස්ථාන අංක 26 දරණ ඔක්කම්පිටිය මහා විද්‍යාලයෙන් (ශාලා අංක 01) වාර්තා වේ. ප.ව. 3.30ට පමණ ජන්දදායකයන් 19 දෙනෙක් තම ජන්දය ප්‍රකාශ කිරීම සඳහා ජන්ද මධ්‍යස්ථානය වෙත පැමිණිය ද වලංගු හඳුනා ගැනීමේ ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වු නිසා ඔවුන්ට ජන්දය පාවිච්චි කිරීමට නොහැකි විය.

මැ.ප්‍ර.නි.ම. ක්ෂේත්‍ර නිරීක්ෂකයා වාර්තා කළ පරිදි ප.ව. 3.03 ට පමණ, ආසන්නයේ පිහිටි වතුයායේ පදිංචි හැටකට (60) ආසන්න පිරිසක් තමන්ගේ ජන්දය පාවිච්චි කිරිම සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල මැතිවරණ කොට්ඨාශයේ වේවැල්හින්න ජන්ද මධ්‍යස්ථානය (ජන්ද ම. අ. 50)වෙත තම වතු යාය මගින් නිකුත්කර ඇති හැඳුනුම්පත් පමණක් අතැතිව පැමිණිය ද ජ්‍යේෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයා එම පිරිසට ජන්දය ප්‍රකාශ කිරිමට අවස්ථාව ලබානොදී ඔවුන්ගේ ජන්ද කාඩ්පත් එකතුකර ගෙන ඇත. ඒ පිළිබඳ **ue.m%.ks.u.** ක්ෂේත්‍ර නිරීක්ෂකයාගෙන් විමසීමේදි ඔහු පවසා ඇත්තේ ජ්‍යේෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයා විසින් එම කාඩ්පත් විනාශ කර ඇති බවයි.

යාපනයේ මහ නගර සභාවට අයත් නාවාන්තුරෙයි ශාන්ත නිකලස් ප්‍රජා මණ්ඩල (ජන්ද ම. අ. 41) ඉදිරිපිට ජන්ද දායකයන් 50 ත් 60 ත් අතර ප්‍රමාණයක් ජන්දය ප්‍රකාශ කිරිමට අවස්ථාව ලබා ගැනීමේ උත්සාහයක නිරත වූ බව මැ.ප්‍ර.නි.ම. ජංගම නිරීක්ෂකයා වාර්තා කර ඇත. ග්‍රාම සේවක නිළධාරියා විසින් නව හැඳුනුම්පතක් ලබා ගැනීමේ දි නිකුත් කරනු ලබන තාවකාලික රිසිට් පත්‍රය පමණක් රැගෙන පැමිණ මෙසේ විරෝධය දැක් වූ මේ කිසිවෙකුට ජන්දය ප්‍රකාශ කිරිමට අවකාශ නොලැබුණි.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය [CMEV] 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.

| | | |
|---|---|---|
| ආචාර්යග පිග සරවනමුත්තු<br>සම කැඳවුම්කරු | සුනිල් ජයසේකර<br>සම කැඳවුම්කරු | උදය කළුපතිරණ<br>සම කැඳවුම්කරු |